# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1709/4 - 2011 ජුනි 06 වැනි සඳුදා - 2011.06.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ පළාත් සභාවේ 2011 අංක 06 දරන ඌව පළාත් ආයුර්වේද හා දේශීය වෛද්‍ය සේවා ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් 2011 අප්‍රේල් මස 28 වැනි දින සම්මත කරන ලදුව 2011 මැයි මස 10 වැනි දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලුදෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

කේ. ඩී. සිරිසේන,<br>
පළාත් සභා ලේකම්,<br>
ඌව පළාතේ පළාත් සභාව.

2011 මැයි මස 25 වැනි දින,<br>
බදුල්ල, රජ වීදියේ පිහිටි ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

*ඌව පළාතේ පළාත් සභාවේ 2011 අංක 6 දරන ආයුර්වේද හා දේශීය වෛද්‍ය සේවා ප්‍රඥප්තිය*

*ඌව පළාතේ ජනතාවගේ නිරෝගීභාවය උදෙසා දේශීය ආයුර්වේද, සිද්ධ හා යුනානි යන වෛද්‍ය ක්‍රම සංරක්ෂණය, සංවර්ධනය හා ව්‍යාප්ත කරලීම සඳහා ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ආයුර්වේද කොමසාරිස් ඇතුළු අනෙකුත් ධූරයන්ද ආයුර්වේද රෝහල් සඳහා රෝහල් කමිටු, පුහුණු කළමනාකරණ මණ්ඩලයක්, ආයුර්වේද සංරක්ෂණ සභා හා උපදේශක සභා පිහිටුවීමත් ඒවා මැනවින් පවත්වාගෙන යාමත් එයට අනුශාංගික වෙනත් කරුණු ඉටුකර ගැනීම සඳහාත් වූ විධිවිධාන සැලැස්වීම සඳහා පනවනු ලබන ප්‍රඥප්තියකි.*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය ඌව පළාතේ පළාත් සභාව 2011 අංක 6 දරන ආයුර්වේද හා දේශීය වෛද්‍ය සේවා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලබන දිනක සිට ක්‍රියාත්මක වන්නේය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

1A - PG 001255 —335 (2011/06)

පළාත් ආයුර්වේද කොමසාරිස් ධුරයක් පිහිටුවීම.

2. මෙහි මතු දැක්වෙන පරමාර්ථ හා අරමුණු ඉටුකර ගැනීම සඳහා (මෙහි මින්මතු දෙපාර්තමේන්තුව වශයෙන් හැඳින්වෙන) ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පළාත් ආයුර්වේද කොමසාරිස් ධුරයක් මෙයින් පිහිටුවනු ලැබේ

පළාත් ආයුර්වේද කොමසාරිස්.

3. (1) මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලැබූ පළාත් ආයුර්වේද කොමසාරිස් එම නාමය හා අභිධානයන් පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේය.

(2) පළාත් ආයුර්වේද කොමසාරිස්වරයා ශ්‍රී ලංකා ආයුර්වේද සේවයේ වෛද්‍ය නිලධාරියෙකු විය යුතු අතර, ඔහු 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32 වැනි වගන්තියට අදාළව ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත්කළ යුතු වන්නේ ය.

(3) පළාත් ආයුර්වේද කොමසාරිස්වරයා ඌව පළාත් දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නියෝග හා මෙහෙයවීම යටතේ ස්වකීය ධුරයේ කටයුතු ඉටුකළ යුතුය.

වෙනත් නිළධාරීන් හා සේවකයින් පත් කිරීම.

4. (1) පළාත් ආයුර්වේද කොමසාරිස්වරයාට තම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටුකරලීම සඳහා අවශ්‍ය වෙතැයි හැඟෙන අනුමත කාර්ය මණ්ඩලය සඳහා, අවශ්‍ය වන නියෝජ්‍ය ආයුර්වේද කොමසාරිස්වරුන් හා සහකාර ආයුර්වේද කොමසාරිස්වරුන් ඇතුළු වෙනත් නිලධරයන්ද ආයුර්වේද වැඩසටහන් සහකාරවරුන්ද අවස්ථාවෝචිත පරිදි ඌව පළාත් ආණ්ඩුකාරවරයා ; ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ පත්කළ යුත්තේය.

(2) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු දරමින් සේවය කරනු ලැබූ සියළුම නිලධරයන් හා සේවකයින් මෙම ප්‍රඥප්තිය යටතේ පත් කරනු ලැබූවන් සේ සලකනු ලැබිය යුත්තේය.

පරමාර්ථ හා අරමුණු.

5. ඌව පළාත් සභාව විසින් වෙන් කරන ලද ප්‍රතිපාදනයන්ට යටත්ව පහත සඳහන් පරමාර්ථ හා අරමුණු ඉෂ්ඨ කිරීම සඳහා පළාත් ආයුර්වේද කොමසාරිස් කටයුතු කළ යුතුය. එනම්,

(1) ජනතාවගේ නිරෝගීභාවය උදෙසා සෞඛ්‍ය ආරක්ෂාව හා ප්‍රවර්ධනයත් ප්‍රතිකාර පහසුකම් සැලසීමත් සහ ප්‍රාථමික සෞඛ්‍ය සංවර්ධනය සඳහා ද අවශ්‍ය ආයතන ඇති කිරීම හා සේවාවන් සැපයීම.

(2) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන ඒකක පිහිටුවීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

(3) ආයුර්වේදයට අනුව රෝග පරීක්ෂා කිරීම හා මහජන සෞඛ්‍ය සංවර්ධනය සඳහා කටයුතු කිරීම ඊට ධෛර්යය දීම.

(4) දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත හෝ සේවයෙහි යෙදවීමට යෝජිත තැනැත්තන්ට ශිෂ්‍යත්ව හා වෙනත් පහසුකම් ප්‍රදානය කිරීමෙන් ද, ආයුර්වේදය සම්බන්ධයෙන් පාඨමාලා සපයනු ලබන හෝ පර්යේෂණ කටයුතුවල යෙදෙන ආයතනවලට මුදල් ආධාර හා වෙනත් උදව් ප්‍රදානය කිරීමෙන්ද, ආයුර්වේදය ඉගෙනීම හා ඒ සම්බන්ධ පර්යේෂණ කටයුතුවලට ධෛර්යය දීම.

(5) පාරම්පරික හා දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය, සංවර්ධනය හා ඒවායේ තත්වය වැඩිදියුණු කිරීම.

(6) ඌව පළාතට ආවේණික වූ පාරම්පරික වෛද්‍ය දැනුම, පුස්කොළ පොත් හා වෛද්‍ය උපකරණ සුරක්ෂිත කිරීම පිණිස, පළාත් ආයුර්වේද කෞතුකාගාරයක් පිහිටුවීම හා පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැලසීම.

(7) පළාත තුළ ඔසු උයන් හා තවාන් පවත්වාගෙන යාම, නඩත්තුව හා අවශ්‍ය පහසුකම් සැලසීම හා ඒ යටතේ ස්වයං රැකියා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට පෙළඹවීම.

(8) පළාතට අවශ්‍ය නිමි ඖෂධ පළාත තුළ නිෂ්පාදනය කිරීම සඳහා පළාත් ඖෂධ නිෂ්පාදනාගාරයක් පිහිටුවීම.

(9) සංචාරක කර්මාන්තය හා සම්බන්ධ වෙමින් දේශීය වෛද්‍ය ක්‍රම ප්‍රචලිත කිරීමට හා ආදායම් උත්පාදන ක්‍රම බිහිකිරීම.

(10) අන්තරායකාරී ඖෂධ මිළදී ගැනීමට අවශ්‍ය සම්බන්ධීකරණය සඳහා සහය වීම.

6. මෙම ප්‍රඥප්තියෙහි විධිවිධානයන්ට යටත්ව ආයුර්වේද කොමසාරිස්වරයාට පහත සඳහන් බලතල ඇත්තේය. ආයුර්වේද කොමසාරිස්ගේ බලතල හා කාර්යයන්.

(1) 5 වගන්තියෙහි නියමිත පරමාර්ථ ඉෂ්ට කිරීමේ දී කොමසාරිස්වරයා විසින් ආයුර්වේද ආරෝග්‍යශාලා, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර, ආයුර්වේද ඖෂධ නිධි, ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන, ආයුර්වේද බෙහෙත් ගබඩා, ඖසු උයන් සහ පැළ තවාන්, ආයුර්වේද කෞතුගාකාරයක් සහ ආයුර්වේද ඖෂධ වෙළඳ සැල් හා පළාත් දිස්ත්‍රික්, ප්‍රාදේශීය, දේශීය වෛද්‍ය හා ආයුර්වේද සංරක්ෂණ සභා පිහිටුවා පවත්වාගෙන යාම හෝ පිහිටුවා පවත්වාගෙන යාමට සැලැස්වීම හෝ ඊට ආධාර අනුබල වීම.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවා ස්ථාපිත කරනු ලබන ආයතන මගින් එළඹෙන තීරණ එකී ආයතනවල නිර්දේශයන්ට යටත්ව ක්‍රියාත්මක කිරීම.

(3) මෙම ප්‍රඥප්තිය යටතේ ස්ථාපිත කරනු ලබන ආයතනයන්හි දත්ත හා සංඛ්‍යා ලේඛන ක්‍රමානුකූලව හා යාවත්කාලීනව පවත්වාගෙන යාම.

(4) මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවා ඇති සියළුම ව්‍යවස්ථාපිත ආයතන උසස් තත්වයේ ප්‍රමිතියෙන් හා තත්කාලීන නිර්දේශයන්ට අනුව පවත්වාගෙන යන්නේදැයි පරීක්ෂා කර බලා ඒ පිළිබඳ කලින් කලට වාර්තා ඉදිරිපත් කිරීම.

(5) පළාත් ආයුර්වේද ඖෂධ පාලක මණ්ඩලය විසින් පාලනය කරනු ලබන ආයුර්වේද ආයතන එම මණ්ඩලයේ නිර්දේශයන්ට අනුව ලියාපදිංචි කිරීම සහ සහතික නිකුත් කිරීම.

7. මෙම ප්‍රඥප්තියේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විෂය භාර අමාත්‍යවරයාට උපදෙස් දෙනු පිණිස උපදේශක මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතුය. එම උපදේශක මණ්ඩලය අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, එහි සංයුතිය පහත සඳහන් පරිදි විය යුතුය. උපදේශක මණ්ඩලයක් පිහිටුවීම.

(1) දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා.

(2) පළාත් ආයුර්වේද කොමසාරිස්වරයා.

(3) පළාත් දේශීය වෛද්‍ය විෂය භාර ගරු අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නියෝජිතයෙක්.

(4) පරිපාලන සේවයේ හෝ අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශ්‍රාමලත් විධායක නිළධාරියෙක්.

(5) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයෙක්.

(6) ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා විසින් නම් කරනු ලබන ආචාර්ය මණ්ඩලයේ නියෝජිතයෙක්.

(7) බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කයන් නියෝජනය කිරීම සඳහා ආයුර්වේද සංරක්ෂණ සභා බල මණ්ඩලවල සාමාජිකයන් දෙදෙනෙකු.

8. 5 වගන්තියේ නියමිත පරමාර්ථ ඉෂ්ඨ කිරීමේදී පාර්ලිමේන්තුව හා පළාත් සභාව විසින් ඒ සඳහා සම්මත කරන ලද මුදල් හා ප්‍රතිපාදන වලින් යම් ප්‍රමාණයක් ඇමතිවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව කොමසාරිස්වරයා විසින්, කොමසාරිස්වරයා විසින් දෙනු ලබන මුදල් ආධාර.

(1) පළාත් ආයුර්වේද අධ්‍යාපන හා පුහුණු කළමනාකරණ මණ්ඩලයට.

(2) පළාතේ ආයුර්වේද පර්යේෂණ මණ්ඩලයට.

(3) පළාතේ ආයුර්වේද ඖෂධ පාලක මණ්ඩලයට

(4) ආයුර්වේද දියුණු කිරීම සහ සංරක්ෂණය සඳහා පිහිටුවා පවත්වාගෙන යනු ලබන වෙනයම් ආයතනයකට.

(5) ආයුර්වේද අධ්‍යාපන කටයුතු කරගෙන යාම සඳහා වෙනයම් සුදුසු තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට ද,

(6) පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ආයුර්වේද සංරක්ෂණ සභා සඳහා ද වෙන් කළ ප්‍රතිපාදන ප්‍රදානය කළ හැකිය.

ආයුර්වේද ආරෝග්‍යශාලා, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර, ආයුර්වේද ඖෂධ නිධි, ඔසු උයන්, ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන, ආයුර්වේද බෙහෙත් ගබඩා, ආයුර්වේද බෙහෙත් වෙළඳසැල් සහ ආයුර්වේද සත්කාරක මධ්‍යස්ථාන ලියාපදිංචි කළ යුතු බව.

9. (1) යම් ස්ථානයක දැනට ආයුර්වේද ආරෝග්‍යශාලාවක්, ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානයක්, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක්, ආයුර්වේද ඖෂධ නිධියක්, ඔසු උයනක්, ආයුර්වේද බෙහෙත් ගබඩාවක් හෝ ආයුර්වේද බෙහෙත් වෙළඳ සැලක් වශයෙන් කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබ, ඒ ස්ථානයෙහි ඒ ආරෝග්‍යශාලාව, ඖෂධ නිෂ්පාදනාගාරය, ඖෂධ නිධිය, ප්‍රතිකාර මධ්‍යස්ථානය, බෙහෙත් ගබඩාව හෝ බෙහෙත් වෙළඳසැල, ආයුර්වේද සත්කාරක මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන තැනැත්තා එහි අයිතිකරු වශයෙන් කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබූවහොත් මිස, ඇමතිවරයා විසින් ඒ සම්බන්ධයෙන් *ගැසට්* පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ නියෝගයකින් නියම කළ හැකි දිනයක පටන් හා ඊට පසු ආයුර්වේද ආරෝග්‍ය ශාලාවක්, ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානයක්, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක්, ආයුර්වේද ඖෂධ නිධියක්, ආයුර්වේද බෙහෙත් වෙළඳ සැලක් හා ආයුර්වේද සත්කාර මධ්‍යස්ථානයක් සඳහා කිසිම ස්ථානයක් යොදා නොගත යුතුය.

(2) (9.1) වැනි උපවගන්තිය යටතේ ප්‍රසිද්ධ කරනු ලැබූ නියෝගයකින් නියමිත දිනය ඒ අනුව ප්‍රසිද්ධ කිරීමේ දින සිට තුන් මාසයකට මෙපිට දිනයක් නොවිය යුතුය.

(3) මෙහි (9.1) උප වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් ආයුර්වේද ආරෝග්‍යශාලාවක, ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානයක, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක, ආයුර්වේද ඖෂධ නිධියක, ඔසු උයනක, ආයුර්වේද බෙහෙත් ගබඩාවක හෝ ආයුර්වේද බෙහෙත් වෙළඳසැලක, ආයුර්වේද සත්කාරක මධ්‍යස්ථානයක කාර්යය සඳහා යම් ස්ථානයක් පාවිච්චි කරනු ලබන අවස්ථාවක ඒ ආරෝග්‍යශාලාව, ඒ ඖෂධ නිෂ්පාදනාගාරය, ඒ ඖෂධ නිධිය, ඒ ප්‍රතිකාර මධ්‍යස්ථානය, ඒ ඖෂධ උද්‍යානය, ඒ බෙහෙත් ගබඩාව හෝ ඒ බෙහෙත් වෙළඳසැල, ආයුර්වේද සත්කාර මධ්‍යස්ථානය අයිතිකරු හෝ භාරව සිටින තැනැත්තා මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරනු ලබන්නේය. එවැනි වරදක් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ වරදකරු කිරීමෙන් අනතුරුව රුපියල් දසදහසකට නොඅඩු රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට යටත්විය යුතුය.

අමාත්‍යවරයාට රෙගුලාසි පැනවිය හැකි බව.

10. (1) පහත සඳහන් එක් කරුණක් හෝ සියල්ලම හෝ සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තිය යටතේ අමාත්‍යවරයාට නියෝග සම්පාදනය කළ හැකිය.

(*අ*) ආයුර්වේද ආරෝග්‍යශාලවක්, ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානයක්, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක්, ආයුර්වේද ඖෂධ නිධියක්, ඔසු උයනක්, ආයුර්වේද බෙහෙත් ගබඩාවක් හෝ ආයුර්වේද බෙහෙත් වෙළඳ සැලක්, ආයුර්වේද සත්කාර මධ්‍යස්ථානයක් වශයෙන් යම් ස්ථානයක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීම, ලියාපදිංචිය සඳහා ගාස්තු අය කිරීම.

(*ආ*) එම ඉල්ලුම්පත්‍රවල ආකෘතිය හා ඒවායේ අන්තර්ගත විය යුතු විස්තර.

(*ඇ*) ඒ ලියාපදිංචි කිරීම වලංගු විය යුතු කාලසීමාව හා නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු ඒ ලියාපදිංචි අළුත් කිරීම සම්බන්ධයෙන් සහතික ප්‍රදානය කිරීම.

(*ඈ*) එම ලියාපදිංචි කිරීම අළුත්කිරීම, ප්‍රතික්ෂේප කිරීම කළ හැකි අවස්ථා.

(*ඉ*) එම ලියාපදිංචි කිරීම සඳහා හෝ අළුත් කිරීම හෝ ලියාපදිංචි කිරීම අළුත් කිරීම සඳහා හෝ ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව හෝ ලියාපදිංචි කිරීම අවලංගු කිරීමට විරුද්ධව ඇමතිවරයා වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව ඇමතිවරයා විසින් දෙනු ලබන තීරණයන්හි, අවසාන භාවය සම්බන්ධයෙන්.

(*ඊ*) ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ආරෝග්‍යශාලා, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර, ආයුර්වේද ඖෂධ නිධි, ඔසු උයන්, ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන, ආයුර්වේද බෙහෙත් ගබඩා හෝ ආයුර්වේද වෙළඳසැල්, ආයුර්වේද සත්කාර මධ්‍යස්ථානයක් සම්බන්ධයෙන් පිළිපැදිය යුතු නියමයන් සහ කොන්දේසි.

(*උ*) ඒවා මගින් පවත්වාගෙන යා යුතු වාර්තා හා බැංකු වාර්තා හා පොත්පත්.

(*ඌ*) අදාළ ආයතන සම්බන්ධයෙන් කලින් කල සැපයිය යුතු වාර්තා හා ඒවාට ඇතුළත් කළ හෝ ඒවායින් ප්‍රතිකාර ගනු ලැබූ රෝගීන්ගේ සංඛ්‍යා විස්තර හා ඒවායේ නියුතු කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර ඇතුළුව එකී වාර්තාවල අඩංගු විය යුතු විස්තර.

(*එ*) අදාළ ආයතන මගින් අයකරගත හැකි ගාස්තු හෝ අයකිරීම් සම්බන්ධ නියමයන්.

(ඒ) එම ආයතනවලට ඇතුළුවීම හා පරීක්ෂා කිරීම සම්බන්ධ බලතල.

(ඔ) අදාළ මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීමේ කාර්යය සහ කොමසාරිස්වරයා විසින් තැබිය යුතු හා පවත්වාගෙන යා යුතු ලේඛන.

(ඕ) එකී ආයතනවල ප්‍රතිකාර ගනු ලබන තැනැත්තන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව හා ඔවුනට නිසියාකාරව සැලසීම හා ප්‍රතිකාර කිරීම සහ සේවා පහසුකම්.

11. (1) මෙම ප්‍රඥප්තිය යටතේ අමාත්‍යවරයා පනවන නියෝග ගැසට් පත්‍රයක පළකල යුතුය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන නියෝග ගැසට් පත්‍රයක් මගින් පළ කිරීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර පළාත් සභාව විසින් එය අනුමත කිරීමෙන් පසු එකී අනුමැතිය ගැසට් පත්‍රයක් මගින් නිවේදනය කල යුතුය. එකී අනුමත කිරීමේ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කළ දින සිට බලාත්මක වන්නේය.

12. ඌව පළාතේ, පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවල රෝගීන්ට ප්‍රතිකාර සඳහා අවශ්‍ය වන ඖෂධවලින් යම් ප්‍රමාණයක් ඌව පළාත් ඖෂධ නිෂ්පාදනාගාරයේ නිෂ්පාදිත ඖෂධ අතුරින් සපයනු ලැබිය හැකිය. නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා

13. (1) වඳවී යන දේශීය ඖෂධ හා පැළෑටි වර්ග සංරක්ෂණය කිරීම, ඒවා හඳුනාගැනීම සඳහා නාමපුවරු පිහිටුවීම හා ජනතාව දැනුවත් කිරීම, අරමුණු කොට පළාතේ ආයුර්වේද රෝහල්, මධ්‍යම බෙහෙත් ශාලා, තෝරාගත් පාසල් හා රාජ්‍ය ආයතන පරිශ්‍ර තුළ ඖෂධ උද්‍යාන පිහිටුවීම හා ඖෂධ තවාන් ඇති කිරීමට පියවර ගත යුතුය. ඖෂධ උද්‍යාන පිහිටුවීම

(2) ඔසු උයන් පිහිටුවීම සඳහා රජයේ ඉඩම් ලබා ගැනීමේ දී 454 අධිකාරය වූ 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥාපනත යටතේ පනවා ඇති විධිවිධානවලට අනුව ඉඩම් ලබා ගැනීම කළ යුතුය.

(3) ඔසු උයන් පවත්වාගෙන යාම හා තවාන් පවත්වාගෙන යාම පළාත් ආයුර්වේද කොමසාරිස්ගේ අධීක්ෂණයට යටත්ව මින් මතු සඳහන් කරනු ලබන ප්‍රාදේශීය ආයුර්වේද සංරක්ෂණ සභාවන්හි වගකීම වන්නේය.

(4) ඖෂධ පැළ තවාන්වලින් පැළ විකිණීම මෙම ප්‍රඥප්තිය යටතේ නිත්‍යානුකූල වන්නේය.

14. (1) මෙහි මින් මතු මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන හා පළාතේ ආයුර්වේද අධ්‍යාපන හා පුහුණු කළමනාකරණ මණ්ඩලය නමින් හැඳින්විය යුතු මණ්ඩලයක් පිහිටුවිය යුතුය. පළාත් ආයුර්වේද, අධ්‍යාපන හා පුහුණු කළමනාකරණ මණ්ඩලය සංස්ථාපනය කිරීම

(2) එකී මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විය යුතුය :-

(අ) ආයුර්වේද කොමසාරිස්වරයා.

(ආ) නියෝජ්‍ය ආයුර්වේද කොමසාරිස්වරයා හෝ ආයුර්වේද කොමසාරිස්වරයා නම් කළ නිළධාරියෙකු.

(ඇ) දියතලාව ආයුර්වේද රෝහලේ අධ්‍යක්ෂවරයා හා මැදගම ආයුර්වේද රෝහලේ අධ්‍යක්ෂවරයා

(ඈ) අනෙකුත් ආයුර්වේද ආයතන හා පළාත් පාලන ආයතනවලින් අමාත්‍යාවරයාගේ නිර්දේශය මත පත්කර ගන්නා ලද වෛද්‍යවරුන් දෙදෙනෙක්.

(ඉ) ඇමතිවරයාගේ නිර්දේශය මත තෝරා ගන්නා ලද රාජ්‍ය සේවයේ නොවන දේශීය, පාරම්පරික හෝ ආයතනික පුහුණුව ලත් වෛද්‍යවරුන් තිදෙනෙක්.

(ඊ) මෙම පළාත් ආයුර්වේද අධ්‍යාපන හා පුහුණු කළමනාකරණ මණ්ඩලයේ කාර්යයන් සඳහා සුදුසු ව්‍යවස්ථාවක් සකස් කොට දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යවරයා එකඟතාව මත ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

(උ) එකී මණ්ඩලයේ නිල කාලය අවුරුදු තුනක් විය යුතු අතර ගණ පූරණය එදිනට සිටින සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට අඩු නොවිය යුතුය.

මණ්ඩලයේ බලතල

15. පහත සඳහන් බලතල පුහුණු කළමනාකරණ මණ්ඩලයට තිබිය යුතුය.

(1) පළාතේ ආයුර්වේදයට අදාළ රාජ්‍ය අංශයෙහි පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

(2) පළාතේ පාරම්පරික හා දේශීය ආයුර්වේද වෛද්‍යවරුන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

(3) ආයුර්වේද අංශයට අදාළ අනෙකුත් සේවා සඳහා උචිත පාඨමාලා තීරණය කිරීම හා පවත්වාගෙන යාම.

(4) ආයුර්වේද අධ්‍යාපනයෙහි යෙදෙන අයට අදාළ ශිෂ්‍යත්ව, ශිෂ්‍යාධාර හා වෙනත් ත්‍යාග හා ආධාර පිරිනැමීම.

(5) අධ්‍යාපන පද්ධති, පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා කළමනාකරණය.

(6) පුහුණු කාර්ය මණ්ඩලයක් පත්කර ගැනීම.

(7) සම්මාන, අභිඥාන පත්‍ර හෝ සහතික පත්‍ර ප්‍රදානය කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම.

පළාත් ආයුර්වේද පර්යේෂණ මණ්ඩලය සංස්ථාපනය කිරීම

16. (1) මින් මතු පර්යේෂණ මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන ඌව පළාත් ආයුර්වේද පර්යේෂණ මණ්ඩලය නමින් හැඳින්විය යුතු ආයතනයක් පිහිටුවිය යුතුය.

(2) පළාත් ආයුර්වේද කොමසාරිස්වරයා හෝ මෙම ප්‍රඥප්තියේ 4.1 වගන්තියේ සඳහන් නියෝජ්‍ය ආයුර්වේද කොමසාරිස්වරයා ඇමතිවරයා විසින් පර්යේෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා ලෙස පත්කළ යුතුය.

(3) පර්යේෂණ මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

(අ) පළාත් ආයුර්වේද කොමසාරිස්වරයා.

(ආ) නාවින්න ආයුර්වේද පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයෙක්.

(ඇ) පළාත් ආයුර්වේද කොමසාරිස්වරයා විසින් නම් කරනු ලබන ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය සේවයට අනුයුක්ත නිලධාරියෙක්.

(ඈ) විශේෂඥ වෛද්‍යවරුන් අතරින් ඇමතිවරයාගේ නිර්දේශ මත පත්කරනු ලබන අයෙක්.

(ඉ) දියතලාව ආයුර්වේද රෝහලේ අධ්‍යක්ෂවරයා.

(ඊ) මැදගම ආයුර්වේද රෝහලේ වෛද්‍ය අධිකාරිවරයා.

(උ) පළාත් හෝ පළාත් පාලන ආයතනයන්හි සේවයේ නියුතු වෛද්‍යවරුන් දෙදෙනෙක්.

(ඌ) පාරම්පරික හෝ දේශීය ආයුර්වේද වෛද්‍යවරුන් අතුරින් ඇමතිවරයාගේ නිර්දේශ මත පත් කරනු ලබන වෛද්‍යවරයෙක්.

(4) පර්යේෂණ මණ්ඩලයේ නිල කාලසීමාව අවුරුදු තුනකි. ගණපූර්ණය තුනෙන් එකකට අඩු නොවිය යුතුය.

(5) ඉහත පළාත් ආයුර්වේද පර්යේෂණ මණ්ඩලයේ කාර්යයන් සඳහා අදාළ ව්‍යවස්ථාවක් පළාත් ආයුර්වේද කොමසාරිස්වරයා විසින් සම්පාදනය කොට පළාත් දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා හා පළාත් දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාව මත ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

17. ආයුර්වේද සංවර්ධනය හා එකී කටයුතු වැඩිදියුණු කිරීමේ අදහසින් ආයුර්වේදයෙහි සියළුම අංශවල පර්යේෂණ කටයුතු පැවැත්වීම සම්බන්ධයෙන් සහ විශේෂයෙන් පහත සඳහන් කාර්යයන් පිළිබඳ වගකීම ඉහත 16.1 වගන්තිය යටතේ ස්ථාපිත කරනු ලබන පර්යේෂණ මණ්ඩලයට පැවරේ. එනම්, මණ්ඩලයේ කාර්යභාරය

(1) පර්යේෂණ ප්‍රතිපත්තියක් සකස් කොට ක්‍රියාත්මක කිරීම.

(2) පාරම්පරික දැනුම සංරක්ෂණය කළ හැකි ආයුර්වේද කෞතුකාගාරයක් පිහිටුවා පවත්වාගෙන යාම.

(3) ඖෂධ පැළෑටි, අමු ඖෂධ, නිමි ඖෂධ හා විවිධ සංස්කරණයන් පිළිබඳ පර්යේෂණ කටයුතු පැවැත්වීම.

(4) රෝග නිදාන, රෝග සහ ඒවාට උචිත චිකිත්සා ක්‍රම පිළිබඳ කාලීන අවශ්‍යතාවයන් අනුව පර්යේෂණ කටයුතු මෙහෙයවීම.

(5) ආයුර්වේද පර්යේෂණ හා එවැනි පර්යේෂණ ආයතන පිළිබඳ කළමනාකරණය.

(6) පහත සඳහන් දේ ගැන එනම් :-

(අ) ආයුර්වේද සාහිත්‍ය.

(ආ) ආයුර්වේද ශාස්ත්‍රයෙහි මූලධර්ම.

(ඇ) ආයුර්වේද රස වෛද්‍ය ක්‍රමය.

(ඈ) ජ්‍යොතිෂ්‍ය, ශාන්තිකර්ම, කෙම් ක්‍රම සහ වෙනත් ආශ්‍රිත චිකිත්සීය විවිධ ක්‍රම.

(ඉ) ආයුර්වේදයට අනුගත වෙනත් දේශීය ස්වාභාවික, වෛද්‍ය ක්‍රම ගැන පර්යේෂණ කටයුතු කිරීම.

(7) ආයුර්වේද ද්‍රව්‍ය ගුණ ශාස්ත්‍රය ගැන පර්යේෂණ කටයුතු කිරීම.

(8) වෘක්ෂායුර්වේද සහ සත්වායුර්වේද පිළිබඳ පර්යේෂණ කටයුතු කිරීම.

(9) ආයුර්වේද වෛද්‍ය සභාව විසින් කලින් කලට කරනු ලබන පර්යේෂණ කටයුතු වලට අදාළ නියමයන් පිළිපැදීම, පර්යේෂණ ප්‍රතිපත්ති ප්‍රකාශයට පත් කිරීමද, පර්යේෂණ මණ්ඩලයේ වගකීම වන්නේය.

(10) ආයුර්වේදයට අවශ්‍ය ඖෂධීය ශාක වලට හානිදායක ආක්‍රමණික හා සංක්‍රමණික ශාක පිළිබඳ අවධානය යොමු කිරීම හා මර්ධනය කිරීමට කටයුතු කිරීම.

18. පහත සඳහන් බලතල පර්යේෂණ මණ්ඩලයට තිබිය යුතුය :- මණ්ඩලයේ බලතල

(1) පර්යේෂණ ආයතන, පර්යේෂණ කාර්යයන් සහ පර්යේෂකයන් සඳහා බලපවත්නා රෙගුලාසි පැනවීමට නිර්දේශ කිරීම.

(2) එක් එක් වර්ෂය සඳහා යෝජිත පර්යේෂණ වැඩපිළිවෙලක් සැකසීම හා ඉහතින් සිදු කරන ලද පර්යේෂණ දර්ශකයන් යාවත්කාලීනව පවත්වාගෙන යාම.

(3) මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලබන ආයුර්වේද පර්යේෂණ ආයතන සඳහා පාලක අනු මණ්ඩල පත් කිරීම සහ ඊට අදාළ අතුරු ව්‍යවස්ථා පැනවීම.

(4) ආයුර්වේද කටයුතු සඳහා අවශ්‍ය යැයි පර්යේෂණ මණ්ඩලය විසින් තීරණය කරන ලද අවස්ථාවලදී දේශීය පාරම්පරික හා වෙනත් සුදුසු යැයි පර්යේෂණ මණ්ඩලයට හැඟෙන කාලීන අන්තර් විෂය සහයෝගය ලබා ගැනීම.

(5) ආයතන මණ්ඩල හා පුද්ගලයන්ගෙන් සහයෝගය ලබා ගැනීම.

(6) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් සිදු කෙරෙන යම් පර්යේෂණ ප්‍රතිඵල ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් පරිබාහිර වූ යම් දේශීය හෝ විදේශීය පුද්ගලයෙක්, පුද්ගල මණ්ඩලයක් හෝ ආයතනයක් භුක්ති විඳින්නේ නම්, ඒ සඳහා මුල්‍යමය හෝ වෙනත් සමාන ප්‍රතිලාභ ලබා ගැනීමට අයිතියක් ඇති අතර, ඒ සඳහා අවශ්‍ය වන ක්‍රියා මාර්ගයන්ට පිවිසීමේ අයිතිය.

(7) ඉහත සඳහන් කාර්යයන් ඉෂ්ඨ කිරීම සඳහා කලින් කල නිශ්චය කරනු ලබන කාර්ය මණ්ඩලයක් පත් කළ යුත්තේය.

පළාත් ආයුර්වේද ඖෂධ සමාලෝචන මණ්ඩලය

19. (1) මින්මතු සමාලෝචන මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන පළාත් ආයුර්වේද ඖෂධ සමාලෝචන මණ්ඩලයක් පිහිටුවිය යුතුය.

(2) මෙම ප්‍රඥප්තියේ 4.1 වගන්තියෙහි සඳහන් නියෝජ්‍ය හෝ සහකාර ආයුර්වේද කොමසාරිස්වරුන් අතරින් එක් අයෙකු ඇමතිවරයා විසින් ඖෂධ සමාලෝචන මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා ලෙස පත්කළ යුතුය.

(3) ඖෂධ සමාලෝචන මණ්ඩලය පහත දැක්වෙන සාමාජික සංඛ්‍යාවකින් සමන්විත යුතුය :-

(අ) පළාත් ඖෂධ නිෂ්පාදනාගාරයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරීවරයා.

(ආ) පළාත් ඖෂධ නිෂ්පාදනාගාරයේ ප්‍රධාන භෛෂජ්ජකවරයා.

(ඇ) පළාතේ ආයුර්වේද අධ්‍යාපන ආයතනයන්හි ආචාර්ය මණ්ඩල අතුරින් ඇමතිවරයාගේ නිර්දේශ මත නිකුත් කරනු ලබන එක් වෛද්‍යවරයෙක්.

(ඈ) පළාත තුළ ලියාපදිංචි ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර ප්‍රධානීන් අතුරින් ඇමතිවරයාගේ නිර්දේශය මත පත් කර ගන්නා අයෙක්.

(4) පළාත් ආයුර්වේද ඖෂධ සමාලෝචන මණ්ඩලයට පහත සඳහන් බලතල තිබිය යුතුය :-

(අ) පළාත තුළ ඖෂධ ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම හා එය ක්‍රියාත්මක කිරීම.

(ආ) පළාත තුළ ඖෂධ බෙදාහැරීම හා භාවිතය විධිමත් කිරීම.

(ඇ) පළාත තුළ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර, අධීක්ෂණය විධිමත් කිරීම හා ප්‍රමිති හඳුන්වාදීම.

(ඈ) ඖෂධවල ගුණාත්මක භාවය ආරක්ෂා කිරීම හා අන්තරායකාරී නොවන බවට සහතික කිරීම.

(ඉ) සියළුම ආයුර්වේද ඖෂධ වර්ග 1961 අංක 31 දරන ආයුර්වේද පනත හා ඊට අදාළ සංශෝධන පනත් හා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංග්‍රහයේ නීතිමය විධිවිධානයන්ට යටත්ව නිෂ්පාදනය කරන බවට වගබලා ගැනීම.

(ඊ) අන්තරායකාරී මෙන්ම අනෙකුත් ආනුෂාංගික අණ පනත් වලට පටහැනි ලෙසට සිදු කරනු ලබන නිෂ්පාදන සම්බන්ධ නීතිමය කටයුතු කිරීම සඳහා ආයුර්වේද කොමසාරිස් වෙත නිර්දේශ ලබාදීම.

(උ) පළාත තුළ ආයුර්වේද ඖෂධ නිෂ්පාදන අලෙවි කරන ස්ථාන පිහිටුවීම, ලියාපදිංචි ගාස්තු අය කිරීම, ඖෂධ සංයෝජකයින් පුහුණු කිරීම, පත් කිරීම හා ලියාපදිංචිය අවලංගු කිරීම.

(ඌ) ආයුර්වේද ඖෂධ සම්බන්ධයෙන් හා ඖෂධ නිධි පවත්වාගෙන යාම සම්බන්ධව තත්කාලයේ පවත්නා අනෙකුත් නීතිමය ප්‍රතිපාදන හඳුනා ගැනීම, හඳුන්වාදීම හා ක්‍රියාත්මක කරවීම.

(එ) ආයුර්වේද නිමි ඖෂධ, වියළි හා අමු ඖෂධ, අපනයනය කිරීම හා ඌව පළාතට ආවේණික වූ ඖෂධීය ශාකවලට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම පළාත් ආයුර්වේද කොමසාරිස්ගේ නිර්දේශ මත පළාත් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත සිදුවිය යුතුය.

(ඒ) ඌව පළාතේ පවත්නා ස්වාභාවික ඖෂධ පළාතෙන් පිටතට ප්‍රවාහනය සඳහා අවශ්‍ය බලපත්‍ර නිකුත් කිරීම, නිර්දේශ කිරීම සහ බලපත්‍ර ගාස්තු නියම කිරීම.

සියළුම මණ්ඩල සඳහා වූ පොදු කරුණු

20. (1) සියළුම මණ්ඩලවල නිල කාලය ලිත් වර්ෂ තුනක් වන්නේය.

(2) ඇමතිවරයාගේ අභිමතය පරිදි මණ්ඩලවල නිල කාලය ගැසට් පත්‍රයක පල කරනු ලබන දැන්වීමකට පසු අවසන් කළ හැක්කේය.

(3) මණ්ඩලයක ගණපූර්ණය තුනෙන් එකකට අඩු නොවිය යුතුය.

(4) සියළු මණ්ඩලවල රැස්වීම් අවම ලෙස මසකට එක් වරක් හෝ පැවැත්විය යුතුය.

(5) මණ්ඩලයක රැස්වීම් වාරයක් වෙනුවෙන් සාමාජිකයන් සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන පාරිශ්‍රමිකයක් ගෙවිය හැක.

(6) රැස්වීම් වාර තුනකට නොපැමිණීම සාමාජිකත්වය අහෝසි වීමට හේතුවනු ඇත.

ආයුර්වේද රෝහල් කමිටු ස්ථාපනය කිරීම

21. (1) ආයුර්වේද රෝහලක් සහ ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවක් මගින් ගුණාත්මක සේවයක් ලබාදීම හා එකී ආයතනයන්හි සංවර්ධනය හා ඊට අවශ්‍ය පහසුකම් හා උපදෙස් ලබාදීම සඳහාත්, මහජනයා අතර සමීප සම්බන්ධතාවයක් ඇති කිරීමත්, අරමුණු කොට සෑම ආයුර්වේද රෝහලක් සහ මධ්‍යම බෙහෙත් ශාලාවක් ආශ්‍රයෙන්ම රෝහල් සංවර්ධන කමිටු පිහිටුවිය යුතුය.

(2) එකී ආයුර්වේද රෝහල් සංවර්ධන කමිටුව පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතුය :-

(අ) රෝහල් සංවර්ධන කමිටුවේ සභාපති ආයතන භාර වෛද්‍යවරයා විය යුතු අතර, පළාත් ආයුර්වේද කොමසාරිස්වරයා, පළාත් පාලන ආයතන ප්‍රධානියා සහ ප්‍රාදේශීය ලේකම්වරයා මෙම කමිටුවේ අනුශාසකවරුන් ලෙස නිල බලයෙන් පත්වන්නේය. මෙම කමිටුව සඳහා දේශීය වෛද්‍ය පළාත් ගරු ඇමතිතුමාගේ එකඟතාවය ලැබිය යුතුය.

(ආ) රෝහල් සංවර්ධන කමිටුවේ කැඳවුම්කරු, කමිටුවේ ලේකම්වරයා විය යුතුය. කමිටු සාමාජිකයන් අතුරෙන් ලේකම්වරයා පත්කළ යුතුය.

22. පහත සඳහන් අය රෝහල් සංවර්ධන කමිටු සාමාජිකයන් ලෙස පත් කළ යුතුය. කමිටුවේ සාමාජිකයන් උපරිම 25 කට සීමා කරනු ලැබේ.

(1) උපරිම 05ක් වන සේ රෝහලට අයත් ප්‍රදේශයේ ආයතන ප්‍රධානීන්.

(2) උපරිම 03ක් වන සේ බල ප්‍රදේශයට අයත් ආරක්ෂක අංශ ප්‍රධානීන්.

(3) උපරිම 08 ක් වන සේ ස්වේච්ඡා සංවිධානවල ප්‍රධානීන් (ආගමික නායකයින්, සේවාලාභීන්, ව්‍යාපාරික ප්‍රජාව හා පරිත්‍යාගශීලීන්)

(4) උපරිම 05ක් වන සේ රෝහල් කාර්ය මණ්ඩලය.

(5) කමිටුවේ ඉතිරි සාමාජිකයින් ප්‍රදේශ වාසීන්ගෙන් තෝරා පත් කර ගනු ලැබේ.

අරමුදල් ගිණුම්ගත කිරීම හා විගණනය

23. (1) රෝහල් සංවර්ධන කමිටුවකට රෝහල් සංවර්ධන අරමුදලක් පවත්වාගෙන යා හැකි අතර, එය විධිමත් පරිදි ගිණුම්ගත කරනු ලැබිය යුතුය.

(2) මෙම අරමුදල් විගණනය සම්බන්ධයෙන් 1987 අංක 42 දරන පනත අදාළ වේ.

(3) අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් වේ.

(4) ඉහත රෝහල් කමිටුවේ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමට අදාළ ව්‍යවස්ථාවක් සකස් කොට දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාව මත ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතුය.

(5) අරමුදලින් රුපියල් දසදහසේ සිට රුපියල් පනස්දහස දක්වා කරනු ලබන වියදම් සඳහා පළාත් ආයුර්වේද කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු අතර, ඊට වඩා වැඩි මුදලක් වියදම් කරන විට විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතුය.

කමිටුවේ නිල කාලය හා කාර්ය භාරය

24. (1) සියළුම සාමාජිකයන්ගේ ධූර කාලය වසර තුනක් වන්නේය.

(2) රෝහල් කමිටුවක සාමාජිකයන් පත් කිරීමේ හා ඉවත් කිරීමේ බලය හා කමිටු විසුරුවා හැරීමේ බලය අමාත්‍යවරයා සතු වන්නේය.

(3) කමිටුවේ ඕනෑම සාමාජිකයෙකුට ඕනෑම අවස්ථාවකදී අමාත්‍යවරයාට ලිඛිතව දැනුම් දීමකින් ඉල්ලා අස්විය හැකිය. එම ඉල්ලා අස්වීම පිළිගැනීම හෝ පිළිනොගැනීම අමාත්‍යවරයාගේ අභිමතය මත සිදුවිය යුතුය.

(4) කමිටු රැස්වීමක ගණපූර්නය තුනෙන් එකක ට අඩු නොවිය යුතුය.

(5) සභාපති කමිටු රැස්වීම් වල මූලාසනය දැරිය යුතු අතර, ඔහු නොමැති අවස්ථාවක කමිටු සාමාජිකයන්ගේ බහුතර කැමැත්ත මත පත්කරනු ලබන සභාපතිට කමිටුවේ කටයුතු කරගෙන යාමට බලය ඇත්තේය. එම කමිටුවේ ගන්නා තීරණය බල සහිත විය යුතුය.

(6) කමිටුව අවම වශයෙන් දෙමසකට වරක්වත් රැස්විය යුතු අතර, කමිටු වාර්තාව ලේකම් විසින් පළාත් ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

(7) කමිටුවේ සාමාජිකයන් හෝ සාමාජිකයකුගේ කලත්‍රයා හෝ පවුලේ සාමාජිකයෙකු පළාත් ආයුර්වේද රෝහල් සඳහා කිසිම සැපයීමක්, මිළදී ගැනීමක් හෝ කොන්ත්‍රාත් ගිවිසුමකට බැඳී නොසිටිය යුතුය.

(8) ඉහත 7 අනු වගන්තියේ සඳහන් තහනම් කටයුත්තක නියුක්ත වුවහොත් ඒ පිළිබඳ පරික්ෂණයකින් පසුව එකී සාමාජිකයා ඉවත් කිරීම සඳහා නිර්දේශ අමාත්‍යවරයා වෙත කමිටුවේ ලේකම් විසින් ඉදිරිපත් කළ යුතුය.

(9) ස්වකීය කාර්යය ඉටු කිරීමේදී ආයතන ප්‍රධානියා විසින් ලිඛිතව දී ඇති කාලය තුළ හැර කමිටු සාමාජිකයෙකු තනිවම කිසිම වේලාවක ආයතනයට ඇතුල්වීම හෝ පරීක්ෂා කිරීම නොකළ යුතු වන්නේය.

අර්ථ නිරූපණය

25. "ආණ්ඩුකාරවරයා" යන්නෙන් ඌව පළාතේ ආණ්ඩුකාරවරයා අදහස් වේ.

"අමාත්‍ය මණ්ඩලය" යන්නෙන් ඌව පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් ඌව පළාතේ දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යවරයා අදහස් වේ. පළාත් සභාව විසුරුවා හැරුණු අවස්ථාවක ඌව පළාත් සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයා යන්නෙන් ඌව පළාත් ගරු ආණ්ඩුකාරවරයා අදහස් කෙරේ.

"ප්‍රධාන ලේකම්" යන්නෙන් ඌව පළාතේ ප්‍රධාන ලේකම්වරයා අදහස් වේ.

"ලේකම්" යන්නෙන් ඌව පළාත් සභාවේ දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

"කොමසාරිස්වරයා" යන්නෙන් ඌව පළාත් සභාවේ ආයුර්වේද කොමසාරිස්වරයා අදහස් වේ.

"පළාත් පාලන ආයතන" යන්නෙන් ඌව පළාතේ මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා අදහස් වේ.

"ආයුර්වේදය" යන්නට ආයුර්වේදය, සිද්ධ, යුනානි හා දේශීය චිකිත්සා ක්‍රමවල වෛද්‍ය කර්ම හා ශල්‍ය කර්මද වංචකර්ම ප්‍රතිකාර ක්‍රම, ස්පා (Spa) ප්‍රතිකාර ඒ ඒ රටවලට දේශීය වූ ද, ඒ ඒ රටවල රජයක් මගින් එසේ යැයි පිළිගනු ලැබුවා වූද, වෙනයම් වෛද්‍ය ක්‍රමයන්ද ඇතුළත් වන අතර, ශාකමය, ස්වාභාවික දේශීය විකල්ප, සමාන්තර, පෙරදිග, පාරම්පරික, සම්පූරක සහ හෝ ඊට සමාන අර්ථයක් දෙන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරනු ලබන කිසියම් ප්‍රතිකාර ක්‍රමයක් හෝ ක්‍රම හෝ රෝග නිවාරණ හෝ සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රම හෝ ක්‍රමයන්ද ඇතුළත් වේ.

"දේශීය වෛද්‍ය හා පාරම්පරික වෛද්‍ය" යන්නෙන් මෙතෙක් ලියාපදිංචි වී ඇති හෝ නොමැති ඌව පළාතේ පදිංචි සියළුම දේශීය වෛද්‍යවරුන් අදහස් වේ.

"ආනුෂංගික අනෙකුත් සේවාවන්" යන්නෙන් ජ්‍යොතිෂ ශාස්ත්‍රඥයන්, භූත කර්මයෙහි යෙදී සිටින්නන් අදහස් වේ.

"ඔසු උයන්" යන්නෙන් දේශීය පාරම්පරික හා ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සඳහා යොදා ගන්නා ගස් වැල්, පැළෑටි වර්ග, ඇතුළත් උයන්ද අදහස් වේ.

වචනාර්ථ

26. මෙම ප්‍රඥප්තියෙහි සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

06-408

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.